# ශ්‍රී ලංකාවේ විදේශිකයන් සඳහා වීසා බලපත්‍ර දීර්ඝකිරීම

ශ්‍රී ලංකාවේ වෙසෙන විදේශිකයන් සඳහා වීසා බලපත්‍ර දීර්ඝ කිරීම සම්බන්ධයෙන් ආගමන හා විගමන දෙපාර්තමේන්තුව විසින් නිකුත් කරන ලද 2020.05.09 දිනැතිනිවේදනයට වැඩිමනත් වශයෙනි.

කොවිඩ් -19 වෛරසය රට තුළ ව්‍යාප්ත වීම හේතුවෙන්, දැනට ශ්‍රී ලංකාවේ පදිංචිව සිටින සියලුම විදේශිකයින්ට නිකුත් කර ඇති සියලුම වර්ගවල වීසා බලපත්‍රයන්හි වලංගු කාලය 2020 ජුනි 11 දක්වා දීර්ඝ කරන ලද අතර එදිනට හෝ ඊට පෙර දිනයක් හා වේලාවක් වෙන් කර ගැනීමෙන් අනතුරුව දෙපාර්තමේන්තුවට පැමිණ වීසා ගාස්තු ගෙවා අදාළ වීසාව ගමන් බලපත්‍රයේ පිටසන් කර ගන්නා ලෙස උපදෙස් දෙන ලදී.

කෙසේ වුවද, බොහෝ රටවල ගුවන්තොටුපලවල් තව දුරටත් වසා තිබීම හේතුවෙන් දැනට ශ්‍රී ලංකාවේ රැඳී සිටින බොහෝ විදේශිකයින්ට මෙතෙක් මෙරටින් පිටව යාමට නොහැකි වී ඇති අතරම එම සංඛ්‍යාව ඉහළ බැවින් 2020 ජුනි 11 දිනට පෙර ඉහත ක්‍රමවේදය ඔස්සේ හමුවක් වෙන් කරවා ගැනීමටද ඔවුන් බොහොමයකට අවස්ථාව නොලැබී ගොස් ඇති බව දෙපාර්තමේන්තුව නිරීක්ෂණය කරන ලදී.

ඉහත සඳහන් තත්වයන් සැලකිල්ලට ගනිමින්, දැනට දිවයිනේ වෙසෙන සියළුම විදේශිකයින්හට ඔවුන්ගේ වීසා බලපත්‍ර විධිමත් කර ගැනීම සඳහා 2020 ජුනි 11 සිට 2020 ජූලි 11 දක්වා බලපැවැත්වෙන පරිදි සියලු වර්ගවල වීසා බලපත්‍රයන්හි වලංගු
කාලය තවත් දින 30 කින්
දීර්ඝ කිරීමට තීරණය කර තිබෙන බව කාරුණිකව දන්වමු.

එබැවින් පහත දක්වා ඇති උපදෙස් පරිදි කටයුතු කරන මෙන් කාරුණිකව ඉල්ලා සිටිමු

1. සියලුම අයදුම්කරුවන් විසින් 2020 ජූලි 11 දිනට හෝ ඊට පෙර පහත වෙබ් දිගුව හරහා දිනයක් හා වේලාවක් වෙන් කර ගැනීමෙන් අදාළ වීසා ගාස්තුව ගෙවා වීසාව විදේශ ගමන් බලපත්‍රයේ පිටසන් කරගන්නා ලෙස මෙයින් දැනුම් දෙමු.

2020 මාර්තු 7 දින සිට 2020 ජූලි 11 දින අතර

කාලයේදී කල් ඉකුත් වන සියලුම වීසාවන් දඩ මුදල් අය කිරීමෙන් නිදහස් වේ.

https://eservices.immigration.gov.lk/vs

2. නියමිත පරිදි දිනයක් හා වේලාවක් වෙන් කර ගෙන පැමිණෙන අයවලුන්හට පමණක් දෙපාර්තමේන්තුවට ඇතුළුවීමට අවසර ඇත. දිනකට සීමිත අවස්ථා සංඛ්‍යාවක් ලබා දෙන බැවින්, වෙන් කර ගන්නා ලද වේලාවට මිනිත්තු 15 කට පෙර අයදුම්කරුවන් දෙපාර්තමේන්තුවට පැමිණිය යුතු බවත් කරුණාවෙන් සලකන්න.

3. මේ සම්බන්ධයෙන් ඔබට වැඩිදුර විස්තර ලබා ගැනීමට අවශ්‍යනම්, පහත සඳහන් ක්‍රම මගින් අපගේ නිලධාරීන් හා සම්බන්ධ විය හැක.

ඉ තැපැල:

කෙටි කාලීන වීසා (Visit Visa)
acvisa1@ immigration.gov.lk
acvisa2@ immigration.gov.lk
acvisa@ immigration.gov.lk

වාස වීසා (Residence Visa)
dcvisa@ immigration.gov.lk

දුරකථන : 070 7101050 (පෙ.ව. 9.00 හා ප. ව. 4.00 අතර පමණක් අමතන්න)

4. නොවැළැක්විය හැකි තත්වයන් හේතුවෙන්, ඔබ විසින් වෙන් කර ගත් දිනට රජය ඇඳිරි නීතිය පනවනු ලැබුවේ නම්, දෙපාර්තමේන්තු පරිශ්‍රයට පැමිණීමෙන් වළකින මෙන් කාරුණිකව දැනුම් දෙමු. ඒ වෙනුවට ඔබ වෙත යොමු කරන ලද "දිනය සහ වේලාව සහිත දැන්වීම" ඉහත සඳහන් විද්‍යුත් තැපැල් ලිපිනයන්හට යොමු කරන්න. ඔබ වෙත නව දිනයක් කඩිනමින් ලබා දෙනු ඇත.

5. මෙම කාලය තුළදී ඔබ දිවයිනෙන් බැහැර වීමට අදහස් කරන්නේ නම්; ඉහත වීසා දීර්ඝ කිරීමට අදාළ වීසා ගාස්තු ගුවන්තොටුපල වෙත ගෙවා දිවයිනෙන් බැහැර වී යාමටද ඉඩ පහසුකම් සලසා ඇත.

ආගමන හා විගමන පාලක ජනරාල්ගේ උපදෙස් පරිදි මෙම නිවේදනය නිකුත් කරේ.